යම් කිසි පුවතකට සෘජුව අදාළ නොවන අවස්ථාවක යම් කිසි අයෙකුගේ හෝ කණ්ඩායමකගේ වාර්ගිකත්වය ඉදිරිපත් නොකළ යුතු බව මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තුළ සඳහන් වේ. ඊට ප්‍රධානතම හේතුව වන්නේ, සෘණාත්මක සන්දර්භයන් තුළ එසේ පුවතකට අදාළ නොවන විටක වාර්ගිකත්වය සඳහන් කිරීම ඔස්සේ, එම වාර්ගිකත්වයන් සෘණාත්මකව ඒකාකෘතික වීමක් සිදුවීමේ ඉහළ ඉඩක් පවතින හෙයිනි.

මීට උදාහරණයක් ලෙසින්, ලංකා රෝහලේ වැසිකිළියකින් අත්බෝම්බයක් හමුවීමේ සිදුවීම දැක්විය හැක. දිවයින පුවත්පත (09/15) මෙහිදී සැකපිට අත්අඩංගුවට ගත් අයගේ වාර්ගිකත්වය "ද්‍රවිඩ" යනුවෙන් දක්වා ඇත. නමුත්, අරුණ පුවත්පත (09/15) එම පුවතම කිසිදු වාර්ගිකත්වයක් සඳහන් නොකරමින් ඉදිරිපත් කර ඇත.

මේ අනුව ගත් විට, මෙම පුවත කිසිදු වාර්ගිකත්වයක් සඳහන් නොකරමින්ද ඉදිරිපත් කළ හැකි නම්, වාර්ගිකත්වය සඳහන් කිරීම ඔස්සේ දිවයින මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කර තිබෙනවා නොවේද? මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Aruna #Divaina**